**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 276 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට  බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ  වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම  ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ACA - 6 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂය තුළදී දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු.4,861,325 ක් වුවද, මූලධන වත්කම් අත්පත් කරගැනීමේ වැය විෂයයන් යටතේ දරන ලද වියදම රු.33,302,066 ක් වූයෙන් රු.28,440,741 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂයයන් යටතේ දරන ලද රු.33,302,066 තුළ කෙරීගෙන යන වැඩ (W.I.P.) වලට අදාල වටිනාකම ද ඇතුලත්ව ඇති බැවින්, එය ACA – 6 ආකෘතිය සමඟ වෙනස් විය හැක, එම නිසා එම වටිනාකම් සංසන්දනය කළ නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආකෘති පත්‍රවල ශේෂයන්, වැය විෂයයන් වල ශේෂයන් සමග සැසඳිය යුතුය. |

**(ආ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ACA - 4 ආකෘතිය අනුව තැන්පත් ගිණුම පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට වූ තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය රු.269,172,238 ක් වුවද එය 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂය වූ රු.245,445,556 ක් සමග සැසඳීමේදී රු.23,726,682 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. දෙසැම්බර් මාසයට පමණක් අදාල ශේෂයක් 2022.01.01 දිනට ශේෂය ලෙසත්, ලැබීම් හා ගෙවීම් ලෙසත් සටහන් කිරීම හේතුවෙන් මෙම වෙනස සිදු වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මෙහි දී 2022.12.31 දිනට ශේෂයේ කිසිදු වෙනසක් සිදු වී නොමැති බව ද කාරුණිකව දන්වා සිටිමි. | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයන් සමඟ එකඟ විය යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ACA - 6 ආකෘතියේ සඳහන් වත්කම් ශීර්ෂ 05 ක සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය 2021 වර්ෂයේ ACA - 6 ආකෘතියේ අවසාන ශේෂයන් සමග සැසඳීමේදී රු.23,645,717 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය පරිගණක දෝෂයකි. භාණ්ඩාගාරය විසින් ගිණුමේ දෝෂයක් හේතුකොටගෙන Bos වාර්තාව, ලෙජරයේ ශේෂය සහ Web upload යන තුනම පරීක්ෂා කර බලා තුලනය කිරීම සඳහා අයිතම කීපයක් ඉවත් කර ඇත. එය 2022.12.31 දිනට තුලනය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් සිදුකරන ලද වෙනස්කමකි. අප විසින් කිසිදු වෙනස් කිරීමක් සිදු නොකල බවත් කාරුණිකව දන්වමි. | සමාලෝචිත වර්ෂයේ වත්කම්වල ආරම්භක ශේෂය ඉකුත් වර්ෂයේ වත්කම්වල අවසාන ශේෂය සමග එකඟ විය යුතුය. |
| (ii) | ACA - 6 ආකෘතියේ සඳහන් එකතුව රු.2,557,871,579 ක් වූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පිළිගනිමි. මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කර විගණනයට දැනුම් දෙන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iii) | ධාවනය සඳහා යොදාගත නොහැකිව තිබුණු යතුරු පැදි 03 ක්, කැබ් රථයක් හා අපහරණ වටිනාකම විගණනයට ඉදිරිපත් නොකෙරුණු තවත් කැබ්රථයක් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කිරීමෙන් රු.355,000 ක් ලැබී තිබුණද එම වත්කම් වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් ශේෂයට අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | අපහරණ කටයුතු ආරම්භ කර ඇති අතර, අපහරණ කටයුතු අවසන් වන තෙක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් ශේෂයට අදාල ගැලපීම් සිදුකල නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. | අපහරණය කල වත්කම්වල පිරිවැය ජංගම නොවන වත්කම් ශේෂයට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ්රථයක් 2022 පෙබරවාරි 14 දින හදිසි අනතුරකට ලක්වීමෙන් රු.1,739,950 ක ඇස්තමේන්තුගත අලාභයක් සිදුවී තිබුණු අතර විගණිත දිනය වූ 2023 අප්‍රේල් 06 දක්වාම මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවසාන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම වාහනය සඳහා ලැබිය යුතු රක්ෂණ වන්දි මුදලින් කොටසක් ලෙස 2022 දෙසැම්බර් 27 දින ලැබී තිබූ රු.555,080 ක් පෞද්ගලික ගරාජයක් වෙත අත්තිකාරම් මුදලක් ලෙස ගෙවා තිබුණද, එම රක්ෂණ වන්දි ලැබීම හා පෞද්ගලික ගරාජයකට ගෙවීම සම්බන්ධයෙන් 2022 මූල්‍ය ප්‍රකාශනවල අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | පිළිගනිමි. පරීක්ෂණ වාර්තාව 2023.03.31 දින ලැබුණු අතර, ඒ වන විට UPPD 7126 දරන කැබ්රථය අදාල ගොනුව ජාතික විගණන උප කාර්යාලය වෙත ලබා දී තිබුණු බැවින් , අවසන් වාර්තාව සැකසීම ප්‍රමාද වූ අතර මේ වන විට අදාල කටයුතු සිදුවෙමින් පවතී 2022.12.27 දින රක්ෂණ සංස්ථාව විසින් ගරාජය වෙත සෘජුවම අංක 836354 දරන චෙක්පත නිකුත් කර ඇති අතර, එය මූල්‍ය ප්‍රකාශයේ සටහන් ii හි පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයේ අදාල ගැලපීම් සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ සිදුකර අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. රක්ෂණ වන්දි ලැබීම් හා අළුත්වැඩියාව සඳහා ගෙවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 ප්‍රකාරව අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම් වාර්ෂිකව අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුල කලමනාකරණය කර ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 හි 3(XIII) ඡේදය අනුව අතිකාල ගෙවීම් පාලනය කරගැනීම කල යුතු නමුත් ඊට අනුකූල නොවන ලෙස වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් අතිකාල වැය විෂය සඳහා වෙන් කරන ලද රු.23,000,000 ක ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ රු.500,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකර ගෙන තිබුණි. | ඔබ විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සමඟ එකඟ වෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව වියදම් කලමනාකරණය කර ගත යුතුය. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ රු.6,000,000 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල ඇස්තමේන්තුගත වටිනාකම (ද්‍රව්‍ය) රු.5,636,026 ක් වූ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දිනට නිමකල යුතු වුවද 2022 දෙසැම්බර් 31 දින වන විට ඇස්තමේන්තුගත වැඩ ප්‍රමාණයෙන් සියයට 66 ක ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණි. | ක්‍රීඩා පිටියේ ඇස්තමේන්තුගත දිග මීටර් 45.23 ක් වන අතර ඉන් මීටර් 30ක් ඉදිකර අවසන් බව කාරුණිකව දන්වා සිටිමි. ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී වෙළඳ පොල පැවති මිල විලනයන් හේතුවෙන් ඇස්තමේන්තුගත මුදලට සරිලන පරිදි ද්‍රව්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් ද්‍රව්‍ය මිලදී ගැනීමට සිදු විය. මේ වන විට ඉතිරි වැඩ කටයුතු සිදුවෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | නිසි කාලරාමුවකට අනුව කටයුතු කර සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ උල්හිටිය ජලාශය ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.11,777,735 ක ප්‍රතිපාදන ලබාදී තිබියදී යටිතල පහසුකම් පමණක් සකසා රු.9,755,348 ක ප්‍රතිපාදන ඉතිරි කර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිගනිමි. රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හා ආර්ථික අවපාතය වැනි පාලනය කල නොහැකි හේතු මත ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට හැකියාවක් නොතිබුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කර ජනතාවට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු සැලැස්විය යුතුය. |
| (ඇ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කල | පිළිගනිමි. | ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට කටයුතු සැලැස්විය යුතුය. |

උස්සැල්ල සායන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,773,300 ක් වැය කර තිබුණු අතර ඉදිකිරීමෙන් පසු ගොඩනැගිල්ල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත භාරදී නොතිබුණි. 2023 මාර්තු 31 දින වන විටද ගොඩනැගිල්ල සායන කටයුතු සඳහා භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ පිළිබඳව දැනුවත් වී නොමැති අතර, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හෝ විගණන පනත යටතේ සඳහන් වී ඇති තොරතුරු සොයාබලා ඒ අනුව කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියට අනුව කටයුතු කල යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39(1) උපවගන්තිය | | ඉකුත් වර්ෂයේ වාර්ෂික විස්තරාත්මක කලමනාකරණ වාර්තාව 2022 අප්‍රේල් 27 දින ගණන් දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කර තිබුණද ඊට අදාලව | පිළිතුරු ලබාදී නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගෙන තිබුණු යෝජිත ප්‍රතිකර්ම, ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව 2023 ජූනි 13 දින වන විටද විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබුණි. | | |

(ii) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ
-------------

| | | | | |
|---|---|---|---|---|
| 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන චක්‍රලේඛය | 1,757,380 | විශ්‍රාමිකයෙකු මියගිය වහාම අදාල වසමේ ග්‍රාම නිලධාරි විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දිය යුතු වුවද එසේ දැනුම් දීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් මියගිය විශ්‍රාමිකයින් 33 ක් සඳහා විශ්‍රාම වැටුප් ලෙස රු.1,757,380 ක් අදාල බැංකු වෙත ප්‍රේෂණය කර තිබුණි. | වැඩිපුර ගෙවන ලද විශාම වැටුප්,විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර ඇත. චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීමටත් වැඩිපුර ගෙවීම් සිදු නොවන අයුරින් කටයුතු කිරීමටත් විශ්‍රාම වැටුප් නිලධාරි වෙත උපදෙස් ලබා දි ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී උක්ත මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණු අවස්ථා 02 ක් නිරීක්ෂණය විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 03 ඡේදයේ සඳහන් පරිදි මාර්ගෝපදේශ අංක 12 සඳහන් ආකෘතියට අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. විගණනය විසින් ඉදිරිපත් කර ඇති අංක i, ii, iv සහ v ට අදාල කරුණු ඇතුලත් | අදාල මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කිරීමට ආකෘති පත්‍රයේ නියමිත ස්ථානයක් නොතිබුණු බවත්, අංක iii සහ vi ට අදාල කරුණු ඇතුලත් කර නොමැති බව පිළිගන්නා බවත් කාරුණිකව දන්වා සිටිමි. | |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මී මැසි ජනපද ඇතිකිරීමේ අරමුණින් රු.1,647,725 ක් වැයකර මී මැසි ජනපද හා උපකරණ මිලදීගෙන තිබුණ ද තෝරාගත් ප්‍රතිලාභීන් 33 අතරින් ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා 2023 මාර්තු 31 දින වන විට ද මී මැසි ජනපද ලබා දි නොතිබුණි. | මී මැසි සංවර්ධන ඒකකයේ සහකාර අධ්‍යක්ෂ දන්වා ඇති පරිදි ජනපද ගණනය කිරීමේ දී මතුව ඇති ගැටළු හේතුකොටගෙන ජනපද ප්‍රතිලාභීන් වෙත ලබා දීම ප්‍රමාද වූ අතර කඩිනමින් ඉතිරි ප්‍රතිලාභීන් වෙත ජනපද ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත.<br>මීමැසි ජනපද ඇති කරන අයගෙන් දැනට මීමැසි ජනපද නොමැති අයට ලබා දෙන ලෙසත් මී මැසි නිෂ්පාදනය වැඩිකර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී. | නිසි කාලරාමුවකට අනුව කටයුතු කර ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බොකන් ඔරුව ග්‍රාම නිලධාරි වසමේ ප්‍රතිලාභීන් 50 දෙනෙකු තෝරාගෙන රු.7,081,240 ක් වැය කර හරිතාගාර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණද 2023 මාර්තු 31 දින වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂයකට වැඩි කාලයක් ගත වුවද ප්‍රතිලාභීන් 41 දෙනෙකු හරිතාගාර ඉදිකර නොතිබීම | පිළිගනිමි. 2023 මාර්තු 07 දින වන විට පොලිටනල් ගෘහඒකක 12ක සම්පූර්ණ වැඩ අවසන් කර ඇති අතර පොලිටනල් ගෘහ ඒකක 15ක ඉදිකිරීම් වැඩ ආරම්භ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මේ වන තෙක් ඉදිකිරීම් ආරම්භ කර නොමැති ප්‍රතිලාභීන් වෙනුවට වෙනත් සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු සිදුවෙමින් | අඛණ්ඩව පසු විපරම් ක්‍රියාමාර්ග තුලින් ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් එම ප්‍රතිලාභීන් වෙනුවෙන් වැයකර තිබුණු රු.4,100,000 ක් සහ බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා වැය කර තිබුණු රු.1,950,000 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | පවතින බවත් කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඇ) | වැලිමඩ, රිදිමාලියද්ද හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභීන්ට ලබාදුන් කිකිලි පැටවුන් 16,450 ක ගෙන් පැටවුන් 9,504 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට මියගොස් තිබීම හේතුවෙන්, රජය විසින් ඒ සඳහා වැයකල රු.4,181,760 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් ඇතිවූ ආහාර හිඟකම ඖෂධ හිඟය යනාදී හේතු නිසා කිකිළි පැටවුන් මියගොස් ඇති අතර ව්‍යාපෘතිය තෝරාගන්නා අවස්ථාවේ වෙළඳපලේ එවැනි තත්ත්වයක් නොපැවති බවත් කාරුණිකව දන්වමි. | පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන වඩාත් ඵලදායී ව්‍යාපෘති තෝරාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.1,911,875 ක් වැය කර මිලදී ගෙන තිබුණු ගෑස් ලිප් 161 ක්, ගෑස් සිලින්ඩර් ලබා නොදීම හේතුවෙන් භාවිතයෙන් තොරව 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව තිබුණි. ඒ අනුව තත්ත්වයෙන් උසස් කිතුල් පැණි නිෂ්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණ ඉටු කරගත නොහැකිව තිබුණි. | පවතින වෙළඳපල තත්ත්වයන් යටතේ **litro** ආයතනය විසින් ගෑස් සිලින්ඩර නිකුත් කිරීම අත්හිටුවීම හේතුවෙන් ගෑස් සිලින්ඩර ලබාගැනීමට නොහැකි වූ බවත් එය අපහට පාලනය කල නොහැකි තත්ත්වයක් බවත් කාරුණිකව දන්වා සිටිමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟා කරගැනීම සඳහා කටයුතු කල යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී අධි අවදානම් කලාපයක් ලෙස හපුතලේ දඹේතැන්න වතුයායේ ජීවත්වන පවුල් 65 ක් නැවත පදිංචි කිරීම සඳහා දඹේතැන්න වතුයායට අයත් ඉඩමක් තෝරාගෙන ප්‍රතිලාභීන් සඳහා නිවාස ඉදිකිරීමේ කටයුතු නිවාස සංවර්ධන අධිකාරිය මගින් ඉටුකරවා ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 14 වන දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2020 ඔක්තෝබර් 14 වන විට අවසන් කල යුතු උක්ත නිවාස ව්‍යාපෘතිය සඳහා 2022 ජනවාරි 01 වන දින විට රු.22,373,078 ක් වැයකර තිබුණු නමුත් 2023 මාර්තු 31 වන දින වන විටද, ප්‍රතිලාභීන්ගේ නිවාස ඉදිකිරීම සම්පූර්ණ කර නැවත පදිංචි කිරීම සිදුකර නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමා තිබුණි. | වතු ඉඩම් පවරාගැනීම සංකීර්ණ කටයුත්තක් වූ අතර වතු ඉඩම් පවරාගැනීම සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා ඇතත් පැහැදිලි පිළිතුරක් ලැබී නැත. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සිදුවිය යුතු කාර්යයන් ඉටුකර ඇත. අදාල නිලධාරීන්ට මේ සම්බන්ධයෙන් දැඩි අවධානය යොමුකර කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | ප්‍රමාදයකින් තොරව අධි අවදානම් කලාපවල වෙසෙන ජනතාව කඩිනමින් නැවත පදිංචි කරවීමට කටයුතු කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහියංගණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.140,961,320 ක ගිවිසුම්ගත මුදලකට 2017 දෙසැම්බර් 18 දින පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්ගත වී තිබුණු අතර, 2023 මාර්තු 31 දින වන විට රු.139,444,590 ක් වැයකර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගිවිසුම්ගත දින සිට දින 546 කින් වැඩ අවසන් කල | පිළිගනිමි. රටේ පැවති ආර්ථික අර්බුධය හේතුවෙන් ද්‍රව්‍ය හිඟකම, මූල්‍ය දුෂ්කරතා, ප්‍රවාහන අපහසුතා, කොවිඩ් වසංගත තත්ත්වය ආදිය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ බව කාරුණිකව දන්වමි. | නියමිත කාලරාමුව තුල ඉදිකිරීම් අවසන් කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතු වුවද, 2023 මාර්තු 31 දින වන විටද වැඩ අවසන් කර නොතිබුණි. එදිනට වැඩ ප්‍රමාද කාලය දින 1,928 ක් වූ අතර එය ඇස්තමේන්තුගත කාලය මෙන් සිවු ගුණයකට ආසන්න වී තිබුණි. | | |
| (ඇ) | ස්වභාවික ආපදා වලින් අධි අවදානම් වලට පත්වූ පවුල් කඩිනමින් එම ස්ථාන වලින් ඉවත් කර ආරක්ෂක ස්ථානයක නැවත පදිංචි කරවා ඔවුන්ගේ ජීවිත ආරක්ෂාව සැලසීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රමුඛ කාර්යභාරයක් වේ. නමුත් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබී තිබුණු රු.310,693,494 ක ප්‍රතිපාදනවලින් රු.240,552,514 ක් වැයකර තිබුණද 2006 වර්ෂයේ සිට අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් 4,149 කින් පවුල් 4,094 ක් නැවත පදිංචි කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | බදුල්ල දිස්ත්‍රික්කයේ අවදානම් පවුල් සුරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමට අවශ්‍ය උපදෙස් දී ඇත. නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් කැබිනට් තීරණ ඉක්මවිය නොහැකි වීම, දිස්ත්‍රික්කයේ ඉඩම් සීමිත වීම, සමූහ නිවාස ඉදිකිරීම සඳහා පොදු ක්‍රමවේද ඉදිරිපත් නොවීම, ප්‍රතිපාදන අක්මුදල් කලට වේලාවට නොලැබීම මත මුළු දිවයිනේම මෙම නිවාස ව්‍යාපෘතිය අසාර්ථක වී ඇත. රේඛීය අමාත්‍යාංශ උපදෙස් අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත. | ප්‍රමාදයකින් තොරව අධි අවදානම් කලාපවල වෙසෙන ජනතාව නැවත පදිංචි කරවීමට කටයුතු කල යුතුය. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ, ඉලුක්තැන්න ග්‍රාම නිලධාරි වසමේ වාණිජ කිරි වගා ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 154 දෙනෙකු තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා රු.3,413,756 ක් වැයකර තිබුණි. එයින් ප්‍රතිලාභීන් 34 දෙනෙකු කිරි වගාව සිදු නොකරන අතර | ගෙවත්තේ ස්වභාවිකව වැවෙන භෝග වාණිජ මුහුණුවරකින් ඉදිරිපත් කිරීමක් පමණක් සිදු කළ බව කාරුණිකව දන්වා සිටිමි.<br>අපේක්ෂිත කාල සීමාව තුළ අදාළ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | ව්‍යාපෘතියේ අරමුණු සඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |

ඉතිරියෙන් අඩකට වැඩි සංඛ්‍යාවක් යැපුම් මට්ටමින් ගෘහ අවශ්‍යතාවය සඳහා පමණක් කිරි වගාව සිදුකරන බැවින් වාණිජ වගාවක් ලෙස කිරි වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථික වාසි ආයතනයට ලබාගැනීමටත්, උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සාධාරණ හා එක හා සමාන අවස්ථා සලසා දීම තුලින් තරඟකාරීත්වයේ වාසි ලබාගැනීමටත් කටයුතු කල යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් 2022 වර්ෂයේදී සිදුකරන ලද රු.2,932,751 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 07 කදී ඉදිරිපත්වූ එකම සැපයුම්කරු තෝරාගැනීම හේතුවෙන් ඉහත ප්‍රසම්පාදන අරමුණු ලගා කර ගැනීම සඳහා සාධාරණ ලෙස උත්සාහ කර නොතිබුණි. | පිළිගනිමි. පෙර භාවිත අත්දැකීම් වෙළඳපල තුල පැවති අවිනිශ්චිත බව භාණ්ඩ හිඟය, මිල උච්චාවචන, ව්‍යාපෘති කඩිනමින් නිමකල යුතු වීම, නැවත මිල කැඳවීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම යනාදී හේතු නිසා එකම සැපයුම්කරු තෝරාගෙන ඇති බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.1,867,600 ක් වැයකර පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස සුදු යකඩ තාච්චි 165 ක් හා මල් මදින පිහි 16 ක් මිලදී ගෙන තිබුණි. | පිරිවිතරයන්ට අනුව මිල ගණන් ඉදිරිපත් කර තිබුණද මිලදී ගන්නා මොහොතේ වෙළඳපල භාණ්ඩ හිගය, මිල ගණන් ඉහල යාම, ව්‍යාපෘතිය කඩිනමින් නිම කල යුතු වීම යනාදිය නිසා ප්‍රමිතියෙන් යුත් තාච්චි මිලදී ගැනීමට කටයුතු කරන ලදී. මල් මදින පිහි මිලදී ගැනීමේදී stainless steel යනු carbon steel වර්ගයක්ම වීම හා කල් පවතින මිටක් වීම හේතුවෙන් එම පිහි භාරගත් බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව කටයුතු කර නියමිත පිරිවිතරයන්ට අනුකූල භාණ්ඩ පමණක් මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්දකැටිය හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුදු ගම්මිරිස් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා 2022 මැයි 20 හා 21 වන දිනවල ස්ථාපිත කරන ලද පිරිවැය රු.4,555,000 ක් වූ ගම්මිරිස් වියලන යන්ත්‍ර 02 ක් 2023 මාර්තු 31 දින වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. | ගම්මිරිස් අස්වැන්න නෙලීම සිදු නොකරන කාලය තුල දී මෙම යන්ත්‍ර සූත්‍ර භාවිතයක් සිදු නොවන බවත් එම කාල වල දී එම යන්ත්‍ර සූත්‍ර භාවිතා කර නිශ්පාදනය කල හැකි විකල්ප නිෂ්පාදන කෙරෙහි යොමු වීමට කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රශස්ථ ලෙස සම්පත් භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංක 21-1100013 දරන විශ්‍රාමිකයා 2015 ඔක්තෝබර් 31 දින මිය ගියද විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් මියයාමෙන් පසුවද 2019 ජූනි 30 දින දක්වා රු.1,412,812 ක් මියගිය විශ්‍රාමලාභියාගේ බැංකු | පිළිගනිමි. 2023.03.31 දින වන විට රු. 562,328 ක් අයකරගෙන ඇති අතර තවදුරටත් අයකර ගැනීමට ඇති මුදල රු. 850,484කි. | අප්‍රමාදව දත්ත පද්ධතිය යාවත්කාලීන කරගැනීමට කටයුතු කර වැඩිපුර ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුමට බැරවී තිබුණු අතර එම මුදල ඔහුගේ උරුමකරුවන් විසින් ලබාගෙන තිබුණි. එයින් රු.850,484 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දින වන විටද නැවත අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ් රථය 2017 ජූලි 29 දින අනතුරට පත් වී තිබුණු අතර එයින් සිදු වූ රු.6,349,333 ක අලාභයෙන් රු.2,500,000 ක් රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණ කර තිබුණි. 2023 මාර්තු 31 දින වන විටද රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය නොකල රු.3,849,333 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. රක්ෂණ වන්දි මුදල තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර රථය අළුත්වැඩියා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි. | අලුත්වැඩියා කටයුතු සඳහා කැඳවූ මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. මෙම අලුත්වැඩියා කටයුතු අවසන් වීමෙන් අනතුරුව පරීක්ෂණ වාර්තා නිර්දේශ අනුව අලාභය අය කර ගැනීමෙන් පසු මුළු මුදල ගෙවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු අතර පරීක්ෂණ කඩිනමින් අවසන් කර අලාභය අයකරගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී වර්ෂ 08 කට පසු ඊට අදාල අලාභ හානිය රු.500,000 ක් ලෙස 2019 මැයි 15 දින බදුල්ල දිස්ත්‍රික් තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණු අතර මු.රෙ 104(4) පරීක්ෂණ | වගකිව යුතු පුද්ගලයාගෙන් අලාභය අයකර ගැනීම සම්බන්ධව නීති උපදෙස් ඉල්ලා ඇත. උපදෙස් ලැබීමෙන් අනතුරුව ඒ අනුව කටයුතු කර විගණනයට සාක්ෂි ඉදිරිපත් කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අලාභය අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාව අනුව අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණද 2023 මාර්තු 31 දින වන වන විට ද  අලාභය අයකර ගෙන නොතිබුණි. | | |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් මගින් කාන්තා කාර්යාංශ ණය වැඩසටහන යටතේ 2012 – 2022 අතර කාලය තුල ප්‍රතිලාභීන් 524 ක් වෙත අපේක්ෂා ණය වැඩ සටහන යටතේ ලබාදී තිබුණු එකතුව රු.10,633,495 ක් වූ ණය මුදලක් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් මගින් චක්‍රීය ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 218 ක් වෙත ලබා දී තිබුණු එකතුව රු.1,984,537 ක් වූ ණය මුදලක් ද , ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් මගින් කාන්තා කාර්යාංශ ණය වැඩසටහන යටතේ 2012 – 2017 අතර කාලය තුල ප්‍රතිලාභීන් 22 ක් වෙත වැන්දඹු ණය වැඩ සටහන මගින් ලබාදී තිබුණු එකතුව රු.180,700 ක් වූ ණය මුදලක් ද සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | ප්‍රතිලාභින් සඳහා ලබාදුන් ණයවලින් හිඟව පවතින ණයවාරික අයකර ගැනිම සඳහා, එම ප්‍රතිලාභින් දැනුවත් කර ඇත. කොවිඩ් හා රට තුල පවතින 19 ආර්ථික තත්වයමත මෙම ප්‍රතිලාභින්ගේ ඉපයීම් ශක්තිය අනපේක්ෂිත ලෙස පහත වැටීම හා ජීවන වියදම ඉහල යාම හේතුවෙන් මෙම ණය වාරික මුදල් අය කර ගැනීම අපහසු වී ඇති බවත් අදාල ණයවාරික නියමිත පරිදි අයකර ගැනිමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වමි. | ණය ගිවිසුම් වල කොන්දේසි අනුව කටයුතු කර නියමිත කාලය තුලදී ණය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවකට නිලධාරීන් ස්ථාන මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවද බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කර පළාත් සභා ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.653,965 ක ණය ශේෂයන් 2022 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි ණය අයකර ගත යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම, සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ | ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, ග්‍රාමීය ජල සම්පාදනය, වාරිමාර්ග කටයුතු, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය හා අපනයන කෘෂිකර්ම කටයුතු යන තිරසර සංවර්ධන අරමුණු රටේ පැවති භාණ්ඩ හිඟය, ආර්ථික දුෂ්කරතා, ඉන්ධන හිඟය යනාදී තත්ත්වයන් හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු අඩාල වීමෙන් සමාලෝචිත වර්ෂයේ දී | තිරසර සංවර්ධන අරමුණු ප්‍රශස්ථ මට්ටමින් ඉටුකර ගැනීමට නිලධාරීන් කාර්යක්ෂමව මෙහෙය විය යුතුය. |

| | |
|---|---|
| සෑම වයස් කාණ්ඩයක් සඳහාම ශරීර සුවතාව වර්ධනය කිරීම, සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හි ම දුරු කිරීම, පරිසර සංරක්ෂණය යන තිරසර සංවර්ධන අරමුණු වලින් සියයට 85 සිට සියයට 95 ක ප්‍රතිශතයක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකරගෙන නොතිබුණි. | සියයට 85 සිට 95ක ප්‍රමාණයක් ඉටු කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 29 ක පුරප්පාඩු 175 ක් පැවතිණි.